සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

බුද්ධ ධර්මය I
பௌத்தம் I
Buddhism I

41 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
- ✳ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

**1.** බුදුරජාණන් වහන්සේ තුළ ඇති නව අරහාදී ගුණ අතරෙන් එකක් විජ්ජාචරණ සම්පන්න නම් වේ. එහි විජ්ජා යන්නෙන් ඤාණාධිගමයන් අටක් ප්‍රකාශ වන අතර ඉන් එකක් නම්,
(1) අකම්පන ඤාණයයි. (2) මහාකරුණා සමාපත්ති ඤාණයයි.
(3) විදර්ශනා ඤාණයයි. (4) ආසයානුසය ඤාණයයි.
(5) සබ්බඤ්ඤුත ඤාණයයි.

**2.** බුදුරාජාණන් වහන්සේ සතු උසස් ඤාණාධිගමයන් පිළිබඳ විවිධ තොරතුරු පාලි මූලාශ්‍රයවල දක්නට ලැබේ. ත්‍රිවිද්‍යා ඤාණ, අෂ්ටවිද්‍යා ඤාණ, දසබල ඤාණාදිය මීට නිදසුන් ය. ඒ අනුව ත්‍රිවිද්‍යා ඤාණ වන්නේ,
(1) ඉද්ධිවිධ, දිබ්බසෝත සහ චේතෝපරිය ඤාණයන් ය.
(2) පුබ්බෙනිවාසානුස්සති, චුතූපපාත සහ ආසවක්ඛය ඤාණයන් ය.
(3) සත්‍ය, කෘත්‍ය සහ කෘත ඤාණයන් ය.
(4) දිබ්බචක්ඛු, පරචිත්තවිජානන සහ මහාකරුණා සමාපත්ති ඤාණයන් ය.
(5) චේතෝපරිය, චුතූපපාත සහ අකම්පන ඤාණයන් ය.

**3.** වරක් බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්යමත් බව පිළිබඳ ව අනඳ මාහිමියන් සහ භික්ෂූන් වහන්සේලා අතර උපන් කතාබහක් සැළ වූ පසු බුදුරජාණන් වහන්සේ අනඳ මාහිමියන් අමතා "තථාගතයන් වහන්සේගේ ආශ්චර්ය අද්භූත බව ඔබට වැටහේවා"යි කරුණු දහනවයක් වදාළ හ. ඉන් එකක් නම්,
(1) අනේකවිධ ඍද්ධිප්‍රාතිහාර්ය දැක්වීමට හැකිවීම ය.
(2) බෝසත් අවධියේ දී ම ආනාපාන සතිය වැඩීම ය.
(3) මව්කුස පිළිසිඳ ගත් බෝසතුන්ට සිව්වරම් දෙවියන්ගේ රැකවරණ ලැබීම ය.
(4) යමාමහ පෙළහර පෑමට තිබූ හැකියාව ය.
(5) සියලු සත්ත්වයන්ගේ ආසයානුසය දැන සිටීම ය.

**4.** මැදුම්සඟියේ උපාලි සූත්‍රය අනුව නිගණ්ඨ ශ්‍රාවක උපාලි ගෘහපතියාට දහම් දෙසූ බුදුරජාණන් වහන්සේ "ගෘහපතිය තොපගේ ගෙය බොහෝ දවස් නිගණ්ඨයන්ට පැන් පොකුණක් මෙන් සිටියේ ය. පෙර සේ ම මතුවට ද ඔවුන්ට පිණ්ඩපාතය දිය යුතු කොට සිතවයි" වදාළ හ. මෙයින් ප්‍රකට වන්නේ බුදුරදුන්ගේ,
(1) සමානාත්මතා ගුණයයි. (2) මහාකරුණා ගුණයයි.
(3) නානාධිමුත්තික ඤාණයයි. (4) ආගමික සහනශීලතාවයයි.
(5) තාදි ගුණයයි.

**5.** "ශ්‍රමණ භවත් ගෞතමයෝ වූ කලී තමන් වෙත එන්නවුන් 'එන්න, මෙහි පැමිණීම මැනවැ'යි' පිළිගන්නාසුළු වෙති. කණට සුව එළවන වදන් තෙපලති. පිළිසඳරෙහි දක්ෂ වෙති. බැම නොහකුළුවති; සුළභ කථා ඇත්තෝ ය. තෙමේ පළමුවෙන් කථා කරති." බුදුරජාණන් වහන්සේ පිළිබඳ මේ ඇගයීම කරන ලද්දේ,
(1) කොසොල් මහරජතුමන් විසිනි. (2) සෝණදණ්ඩ බමුණා විසිනි.
(3) සච්චක පඬිවරයා විසිනි. (4) දීඝජානු කෝලිය පුත්‍රයා විසිනි.
(5) අනේපිඬු සිටුතුමා විසිනි.

**6.** බුදුරදුන් විසින් දේශිත ධර්මයත්, පැනවූ විනයත් පිටක වශයෙන් ත්‍රිවිධ ය. එහි විනය යැයි කියනු ලබන්නේ,
(1) මැනවින් ප්‍රකාශ කර ඇති බැවිනි.
(2) සසුනේ ආයුෂය වේ යන අර්ථයෙනි.
(3) ධර්මයට අතිරේක වශයෙන් වදාළ බැවිනි.
(4) අර්ථය මැනවින් එළිදක්වන බැවිනි.
(5) විශේෂ නය ක්‍රම ඇති බැවිනි.

**7.** සූත්‍ර පිටකයේ සැකැස්ම පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දීඝනිකාය වර්ග පහකින් යුක්ත ය.
(2) අංගුත්තර නිකායෙහි නිපාත විස්සකි.
(3) සීලක්ඛන්ධ වර්ගය ඇතුළත් වන්නේ සංයුත්ත නිකායෙහි ය.
(4) මජ්ඣිම නිකාය පණ්ණාසක තුනකි.
(5) කෝසල සංයුත්තය ඇතුළත් වන්නේ ඛුද්දක නිකායෙහි ය.

**8.** චතුරාර්ය සත්‍යය යනු උත්තරීතර මනුෂ්‍යයකු වන බුදුරජාණන් වහන්සේ විසින් දුක හා දුකින් මිදීම පැහැදිලි කරමින් කරන ලද දේශනාවක් මිස දේව අනාවරණයක් නො වේ. ඒ බව සෘජුව ම ප්‍රකාශ වනුයේ,
(1) ධම්මසංගිණී ප්‍රකරණයෙහි ය.
(2) චුල්ලවග්ගපාළියෙහි ය.
(3) විශුද්ධි මාර්ගයෙහි ය.
(4) ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ය.
(5) මිලින්ද ප්‍රශ්නයෙහි ය.

**9.** "ලෝභය ද, ද්වේෂය ද, මෝහය ද අකුසල චේතනාවෝ ය. ඒවා අහිත පිණිස, දුක් පිණිස වේ. අලෝභය ද, අද්වේෂය ද, අමෝහය ද කුසල චේතනාවෝ ය. ඒවා හිත සුව පිණිස වේයැ'යි නිදහස්ව සිතා තීරණය කළ යුතුයැ'යි" බුදුරදුන් විසින් දේශනා කරන ලද්දේ,
(1) සුභ මානවකයාට ය.
(2) උපාලි ගෘහපතියාට ය.
(3) මහානාම ශාක්‍යයන්ට ය.
(4) රාහුල තෙරුන් වහන්සේට ය.
(5) කාලාම ගෝත්‍රිකයන්ට ය.

**10.** මෙලොව සුවසෙත මෙන් ම පරලොව සුවසෙත ද තමාගේ යහපත මෙන් ම අනුන්ගේ යහපත ද සමබරව සාධනය කරගැන්මට අදාළ උපදෙස් බුද්ධ දේශනාවල නොයෙක් තැන විසිර තිබේ. පහත දැක්වෙන ධර්මපාඨ අතුරෙන් එම උපදේශය ප්‍රකාශ **නොවන** පාඨය කුමක් ද?
(1) දිට්ඨේව ධම්මේ යෝ චත්ථෝ යෝ චත්ථෝ සම්පරායිකෝ
(2) අත්තහිතාය පටිපන්නෝ පරහිතාය ච
(3) ද්විචක්ඛුං පන සේට්ඨං සෙට්ඨං පුරිස පුග්ගලං
(4) කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති
(5) අත්තනාව සුදන්තෙන නාථං ලභඨ දුල්ලභං

**11.** බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ ගුරුකුලවල දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් වන්නේ,
(1) නිර්මාණවාදී වීම ය.
(2) අත්තකිලමථානුයෝගී වීම ය.
(3) භාවනාව පිළිගැනීම ය.
(4) බ්‍රහ්මචාරී වීම ය.
(5) ආජීවකයන් වීම ය.

**12.** උපසපන් භික්ෂූන් වහන්සේ නමකට ලබා දිය යුතු අවවාද සතරක් විනය මහාවග්ගයේ සඳහන් වේ. ඒවා නිස්සය ධර්ම නම් වන අතර ඉන් එකක් නම්,
(1) පැවිද්දන් සමගියෙන් ක්‍රියා කළ යුතුය යන්නයි.
(2) වැඩිහිටි භික්ෂූන්ට වතාවත් කළ යුතුය යන්නයි.
(3) ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්ට අනුව හික්මිය යුතුය යන්නයි.
(4) පැවිද්ද රුක්මුල්, සෙනසුන් ඇසුරු කිරීම පිණිසය යන්නයි.
(5) බොහෝ ජනයාගේ හිතසුව පිණිස දහම් දෙසිය යුතුය යන්නයි.

**13.** "යම් භික්ෂුවක් කෙලෙස් නැති කිරීමට සමත් වූ මාර්ගඵලාදිය නොලැබ ම ඒවා තමා වෙත ඇතැයි" පවසයි නම් පරිජි වේ. සතර පාරාජිකාවන්ගෙන් එකක් වන මෙය හැඳින්වෙන්නේ,
(1) උත්තරිමනුස්සධම්ම යනුවෙනි.
(2) සංඝාධිසේස යනුවෙනි.
(3) අකරණීය යනුවෙනි.
(4) මනුස්සවිග්ගහ යනුවෙනි.
(5) පාටිදේසනීය යනුවෙනි.

**14.** බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වෙතින් ප්‍රකට වන සුවිශේෂී ගුණ අතර ඤායපටිපන්න යනු,
(1) දන් පිළිගැන්වීමට සුදුසු යන්නයි.
(2) නිවැරදි පිළිවෙතෙහි පිහිටි යන්නයි.
(3) ඍජු මාර්ගයෙහි ගමන් කරන යන්නයි.
(4) විදර්ශනා මාර්ගයට සපැමිණි යන්නයි.
(5) දුරසිට ගෙන එන පූජාවන්ට ද යෝග්‍ය යන්නයි.

**15.** ලද දෙයින් සතුටු වීම ගිහිගෙය හැර සසුන්වන් කුල පුත්‍රයකු තුළ ප්‍රකට විය යුතු උසස් චරිත ලක්ෂණයක් බව බුදුරජාණන් වහන්සේ බොහෝ විට වදාළහ. එයට ප්‍රතිපක්ෂ චර්යාව හැඳින්විය හැක්කේ කවර ව්‍යවහාරයෙන් ද?
(1) මහිච්ඡතා (2) හස්සාරාමතා (3) විහුසනට්ඨානා
(4) දුභරතා (5) නිද්දාරාමතා

**16.** බුද්ධකාලීන භාරතයේ විසූ බ්‍රාහ්මණයන් මෙන් ම ශ්‍රමණයන් ද කිසියම් පරම නිෂ්ඨාවක් වෙත ශ්‍රාවකයන් මෙහෙයවූ අතර බමුණු දහම අනුව එම නිෂ්ඨාව හඳුන්වන ලද්දේ,
(1) කේවලත්වය යනුවෙනි. (2) බ්‍රහ්ම සහව්‍යතාව යනුවෙනි.
(3) සංසාර ශුද්ධිය යනුවෙනි. (4) අසංඛතය යනුවෙනි.
(5) ඉෂ්ටාපූර්තය යනුවෙනි.

**17.** සර්වබලධාරී බ්‍රහ්මයකු ඇතැ'යි ද, වේදය ඔහු විසින් ප්‍රකාශිතයැ'යි ද පුරාණ ඍෂිවරුන් මගින් බමුණන්ට එය ලැබුනේ යැයි'ද වෛදික සම්ප්‍රදාය පිළිගනී. එම ඉගැන්වීම බැහැර කරමින් බුදුදහම කරුණු දක්වා ඇත්තේ,
(1) දම්සක් පැවතුම් සූත්‍රයේ ය. (2) බ්‍රාහ්මණ ධම්මික සූත්‍රයේ ය.
(3) බ්‍රහ්මවිහාර සූත්‍රයේ ය. (4) චංකි සූත්‍රයේ ය.
(5) තෙවිජ්ජ සූත්‍රයේ ය.

**18.** බුද්ධකාලීන භාරතයේ මහ පිරිස් පිරිවරා සිටි ප්‍රසිද්ධ ශාස්තෘවරුන් සදෙනෙකු වූ බව සඳහන් වේ. විවිධ මතවාද දැරූ ඔවුන් සියලු දෙනාට ම පොදු ඉගැන්වීමක් වූයේ,
(1) සියල්ල සැකයට භාජනය කිරීම ය.
(2) නිර්මාණවාදය නොපිළිගැනීම ය.
(3) කර්ම විපාක බැහැර කිරීම ය.
(4) වීර්යය, උත්සාහය නිෂ්ඵලයැ'යි ඉගැන්වීම ය.
(5) සියල්ල පූර්ව කර්මානුරූපීයැ'යි පිළිගැනීම ය.

**19.** බුදුරජාණන් වහන්සේ පහළ වූ අවධිය වන විට භාරතයේ සාම්ප්‍රදායික බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට ප්‍රතිචාර දක්වමින් ශ්‍රමණ ඉගැන්වීම් ප්‍රචලිත වූ බව පිළිගනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කළ කරුණක් වන්නේ කුමක් ද?
(1) ආර්ථික හා දේශපාලන වෙනස්වීම්
(2) බමුණු කුලය ධනයෙන් පිරිහීම
(3) රජදරුවන් විසින් බමුණන් ප්‍රතික්ෂේප කිරීම
(4) ත්‍රිවේදය ප්‍රගුණ කළ බමුණන් නොසිටීම
(5) අධ්‍යාපනය ශ්‍රමණ පඬිවරුන් අතට පත්වීම

**20.** මිනිස් සමාජයේ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කෙරෙන ප්‍රධාන මූලාශ්‍රය දීඝ නිකාය අග්ගඤ්ඤ සූත්‍රයයි. එම සූත්‍රය,
(1) සමාජය සමතාවෙන් විෂමතා වෙත විකාසය වූ බව නොපිළිගනී.
(2) හේතුඵල ධර්මයට අනුගත වේ.
(3) සමාජ පරිණාමයට තුඩු දුන් මානසික සාධක නොදක්වයි.
(4) වර්ණාශ්‍රම ධර්ම පිළිගනී.
(5) කර්මානුරූපව ම සුවදුක් ලැබෙන බව උගන්වයි.

**21.** විනය මූලාශ්‍රය අනුව බුදුරදුන් විසින් පාමොක් උදෙසා විනය නීති පනවන ලද්දේ බුද්ධත්වයෙන් විසිවසරක් ඇවෑමෙනි. භික්ෂු සංඝයා අතරේ පැනනැගුණු විවිධ ගැටලු ඊට හේතු විය. ආසවට්ඨානීය ධර්ම නම් වූ එම ගැටලු අතරෙන් එකක් වන්නේ,
(1) ඇතැම් භික්ෂූන් බුදුරදුන්ගේ අනුශාසනා ඉක්මවා යෑම ය.
(2) ධර්ම විනය පිළිබඳ මතභේද ඇති වීම ය.
(3) ඇතැම් භික්ෂූන් දේවදත්ත තෙරුන්ගේ වසඟයට පත් වීම ය.
(4) සසුනෙහි වැඩිහිටි භික්ෂූන් බහුල වීම ය.
(5) තීර්ථකයන් සසුන්ගත වීම ය.

**22.** භික්ෂු සමාජය ආරම්භයේ දී බුදුරදුන් විසින් විහාර සෙනසුන් අනුදැන නොතිබූ බැවින් භික්ෂූහු ආරණ්‍ය වෘක්ෂමූල ආදියෙහි දිවා රෑ ගත කළහ. බුදුරදුන්ගේ ද අනුමැතිය ඇතිව පළමුවරට විහාර සේනාසන තනවා පූජා කරන ලද්දේ,
(1) අනේපිඩු සිටුතුමන් විසිනි.
(2) බිම්බිසාර මහරජතුමන් විසිනි.
(3) රජගහ නුවර සිටුතුමන් විසිනි.
(4) විශාඛා මහෝපාසිකාව විසිනි.
(5) ජීවක වෛද්‍යාචාර්යතුමන් විසිනි.

**23.** ථෙරවාද ධර්ම සංගායනා පැවැත්වීමට තුඩු දුන් ශාසනික පසුබිම, එම සංගායනා පිළිබඳ සංවිධාන කටයුතු, ඒවායේ ප්‍රතිඵල ආදී කරුණු හෙළිකර ගැනීමට උපකාරී වන ප්‍රාථමික මූලාශ්‍රය රාශියකි. ඒවා අතුරෙන් පාලි ත්‍රිපිටකයට ඇතුළත් වන්නේ,
(1) දීපවංශයයි.
(2) නිකාය සංග්‍රහයයි.
(3) මහාවංශයයි.
(4) සමන්තපාසාදිකාවයි.
(5) චුල්ලවග්ගපාළියයි.

**24.** ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් ආසන්නතම හේතුව සුභද්‍රගේ අභද්‍ර ප්‍රකාශය වුව ද තවත් ශාසනික ගැටලු රැසක් ඒ පසුබිමෙහි විද්‍යමාන වූ බව මූලාශ්‍රය ඇසුරෙන් පෙන්වා දිය හැකි ය. ඉන් එකක් නම්,
(1) ඇතැම් භික්ෂූන් වහන්සේලා නොයෙකුත් විෂමාචාරවල නිරත වීම ය.
(2) මහායාන අදහස් පැතිර යාම ය.
(3) භික්ෂූන් ගුරුකුල වශයෙන් බෙදී යාම ය.
(4) අනාගතයේ දී අධර්මය මතු වී ධර්මය යටපත් වනු ඇතැ'යි ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ට පෙනීයාම ය.
(5) භික්ෂූන් පොහෝ පවුරුණු ආදිය නොකිරීම ය.

**25.** දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්න හේතුව ලෙස දැක්වෙන්නේ විශාලා මහනුවර වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් පිළිගත් දස අකැප වස්තුවයි. එහි ජලෝගිකප්ප යන්නෙන් අදහස් වන්නේ,
(1) ඇදුරු පරපුරේ කළ දෑ එසේම කිරීම යන්නයි.
(2) රන්රිදී මසුකහවනු පිළිගැනීම කැපය යන්නයි.
(3) නොපැසුණු රා පානය කිරීම කැපය යන්නයි.
(4) කිරිත්, දීකිරිත් නොවූ විකෘතිය වැළඳීම කැපය යන්නයි.
(5) දාවලු නැති නිසීදනයක් භාවිත කිරීම කැපය යන්නයි.

**26.** පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් ධර්මානුකූල **නොවන්නේ** කුමක් ද?
(1) සියලු සංඛත ධර්ම ත්‍රිලක්ෂණයෙන් යුක්ත වේ.
(2) අස්මිමානය උගුලුවාලීමට අනිත්‍ය සංඥාව වැඩිය යුතු ය.
(3) ත්‍රිලක්ෂණය සිත්හි ලා වැඩීම විපස්සනාවයි.
(4) ඛන්ධායතන ධාතු ත්‍රිලක්ෂණයට යටත් වේ.
(5) ධ්‍යාන සමාපත්ති තුළින් උපදින සැපය අනිත්‍ය නො වේ.

**27.** සත්ත්වයා හා ලෝකය ස්කන්ධ, ධාතු, ආයතන වශයෙන් විභජනය කොට දැක්වීම බුද්ධ දේශනාවල නොයෙක් තැන දැකගත හැකි ය. එහි එන අටළොස් ධාතු අතරෙන් එකක් නම්,
(1) නිබ්බාන ධාතුව ය.
(2) තේජෝ ධාතුව ය.
(3) අරූප ධාතුව ය.
(4) ආකාස ධාතුව ය.
(5) මනෝවිඤ්ඤාණ ධාතුව ය.

**28.** බුදුදහමට අනුව ත්‍රිලක්ෂණය දක්නා තැනැත්තාගේ සුවිශේෂී චරිත ලක්ෂණයක් වන්නේ,
(1) සැදැහැවත් අයකු වීමයි.
(2) මහිච්ඡතාවෙන් ක්‍රියා කිරීමයි.
(3) නොඉවසිලිවන්තව ක්‍රියා කිරීමයි.
(4) ආත්මාර්ථ සාධනයට ම යොමු වීමයි.
(5) අටලෝ දහමින් කම්පා නොවීමයි.

**29.** බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ බුදුබව ලබනු පිණිස වීර්ය වැඩූ රමණීය පරිසරය වර්ණනා කර ඇත්තේ,
(1) වනරෝප සූත්‍රයේ ය. (2) මිලින්ද ප්‍රශ්නයේ ය.
(3) පට්ඨානප්‍රකරණයේ ය. (4) අරියපරියේසන සූත්‍රයේ ය.
(5) පරිවාරපාළියේ ය.

**30.** ගෘහස්ථ දිවිපැවැත්මෙහි සාර්ථකත්වය සඳහා සමාජ සංස්ථා අතර ක්‍රියාත්මක විය යුතු සාරධර්ම මාලාවක් සිගාල සූත්‍රයේ සදිසා නමස්කාරයේ දැක්වේ. ඒ අනුව ශ්‍රමණ-බ්‍රාහ්මණයන් විසින් ගෘහස්ථ ප්‍රජාවට අනුශාසනා කළ යුත්තේ,
(1) පින් දහම් කිරීමට ය. (2) මෝක්ෂය ලබා ගැනීමට ය.
(3) වැඩිහිටියන්ට සැලකීමට ය. (4) ස්වර්ග මාර්ගයෙහි යාමට ය.
(5) පුදසිරිත් පැවැත්වීමට ය.

**31.** අනේක පරියායෙන් කරුණු පැහැදිලි කිරීම බුදුදහමේ විශේෂ ලක්ෂණයකි. ඒ අනුව ධර්මය තුළ සසර දුක පැහැදිලි කර ඇති අවස්ථාව කුමක් ද?
(1) දුක්ඛේන සුඛං අධිගන්තබ්බං (2) ඒතං මම එසෝ හමස්මිං, එසෝමේ අත්තා
(3) කිච්ඡංවතායං ලෝකෝ ආපන්නෝ (4) සයං කතං දුක්ඛං
(5) අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ

**32.** දුක්ඛසමුදයාර්ය සත්‍යය යටතේ තණ්හාවේ ප්‍රභේදයක් ලෙස දක්වා ඇති විභව තණ්හා යන්නෙහි නිවැරදි අර්ථය කුමක් ද?
(1) භවයෙන් අත්මිදීමට ඇති ආශාව
(2) උච්ඡේද දෘෂ්ටිය තුළින් උපදනා තණ්හාව
(3) පුනර්භවය පිළිගන්නා තැනැත්තා තුළ ඇති වන තණ්හාව
(4) පස්කම් සුව විඳීමට සත්ත්වයා තුළ ඇති කැමැත්ත
(5) නිත්‍යාත්මයක් ඇතැ'යි සැලකීමෙන් උපදනා තණ්හාව

**33.** ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු බෞද්ධ විමුක්ති මාර්ගයයි. එසේම එය ජීවන ප්‍රතිපදාවක් ද වෙයි. එම ප්‍රතිපදාවෙහි ඇතුළත් සම්මා කම්මන්තය අනුව,
(1) දැහැමි රැකීරක්ෂාවල නිරත විය යුතු ය. (2) කයින් සිදුවන අකුසල් තුනෙන් වැළකී සිටිය යුතු ය.
(3) නොකළ යුතු වෙළඳාම් නොකළ යුතු ය. (4) රාජ්‍ය සේවයෙහි ද නිරත විය හැකි ය.
(5) උත්සාහයෙන් ධනය ඉපයිය යුතු ය.

**34.** අවිජ්ජා සංඛාර ආදී හේතුප්‍රත්‍ය ඇති කල්හි ජරාමරණාදී සසර දුක් උපදනා අයුරු ද එකී හේතුප්‍රත්‍ය නැති කල්හි එම දුක් නිරුද්ධ වන අයුරු ද උගන්වන ද්වාදසාංගික පටිච්චසමුප්පාද ධර්මයෙහි 'අවිජ්ජා' යන්නෙන් අර්ථවත් වන්නේ කුමක් ද?
(1) ධර්මාවබෝධයෙන් තොර බව (2) පින් පව් නොදැන ක්‍රියා කිරීම
(3) මිථ්‍යා දෘෂ්ටියක එල්බ සිටීම (4) චතුරාර්ය සත්‍යය නොදැනීම
(5) බොහෝ ඇසූ පිරූ තැන් නැති බව

**35.** සාස්වත-උච්ඡේද ආදී කවර දෘෂ්ටියක හෝ අන්තගාමීව එල්බ ගනිමින් එය ම සත්‍යයයැ'යි ද අන් සියල්ල අසත්‍යයැ'යි ද සලකා ගැනීම පුද්ගලයාගේ චින්තනයට ද චරණයට ද විවිධාකාරයෙන් අවැඩදායක බව පෙන්වා දෙන බුද්ධ දේශනාව කුමක් ද?
(1) අග්ගිවච්ඡගොත්ත සූත්‍රය (2) සච්චවිභංග සූත්‍රය
(3) සම්මාදිට්ඨි සූත්‍රය (4) මහානිදාන සූත්‍රය
(5) අග්ගඤ්ඤ සූත්‍රය

**36.** ගුණධර්මවලින් තොර මිනිසා තිරිසන් සතෙකුට සමාන බව බුදුදහම පෙන්වා දෙයි. කරුණු එසේ වුව ද ධර්මානුකූලව සලකන විට නිවැරදි වන්නේ,
(1) පව්කම් කළ මිනිසකුට විමුක්තියක් නැත යන්නයි.
(2) මිනිසකුට කිසිසේත් ම දේවානුභාවය ඉක්මවිය නොහැකිය යන්නයි.
(3) බුදු දහම මිනිසකු සතු මානසික ශක්තිය මිස කායික ශක්තිය අගය නොකරයි යන්නයි.
(4) මනුෂ්‍ය ඝාතනයක් කළ විට උපසම්පදාව අහිමි වෙයි යන්නයි.
(5) දෙවියන්ට ද පාරමිතා පිරීමට හැකියාව ඇත යන්නයි.

**37.** "මෙම ක්‍රියාව අයහපත් ය, මෙයින් අවැඩක් ම සිදු වෙයි. මෙය යහපත් ය, මෙයින් සැපතක් ම වේ"යැ'යි නිශ්චය කරගනු සඳහා බුදු දහමෙහි බොහෝ මග පෙන්වීම් කර තිබේ. එබඳු එක් ධර්ම පාඨයක් නම්,
(1) පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං යන්න ය.
(2) ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ සාසනේ යන්න ය.
(3) අප්පමාදෝ අමතපදං යන්න ය.
(4) සබ්බාකුසලධම්මපහීනෝ කුසලධම්ම සමන්නාගතෝ යන්න ය.
(5) යස්ස අස්සුමුඛෝරෝදං විපාකං පටිසේවති යන්න ය.

**38.** ශීල ශික්ෂාව පිළිපැදීමෙන් මෙලොවදී මෙන්ම පරලොවදී ද ලැබෙන අනුසස් පහක් බුදුදහමෙහි දක්වා තිබේ. ඉන් එකක් නම්,
(1) සිල් රකින්නාට උසස් තනතුරු ලැබේ යන්නයි.
(2) සීල සමාදානයෙන් ම නිවන් පසක් කළ හැකිය යන්නයි.
(3) සිල්වත් තැනැත්තා චාරිත්‍ර පමණක් පිළිපදියි යන්නයි.
(4) ශීලය වතක් මෙන් ආරක්ෂා කළ යුතුය යන්නයි.
(5) සිල්වත් තෙමේ අප්‍රමාදී වන බැවින් මහත් වූ භෝගස්කන්ධයක් ලබයි යන්නයි.

**39.** කවරකුගේ වුව ද දියුණුවක් සැපතක් දුටු විට ඒ පිළිබඳ කිසිසේත් ම ඊර්ෂ්‍යා නොකළ යුතු අතර ඉන් සතුටට පත්විය යුතු ය. මෙම ගුණය හැඳින්විය හැක්කේ,
(1) මුදිතාව යනුවෙනි. (2) අර්ථචර්යාව යනුවෙනි.
(3) මෙත්තාව යනුවෙනි. (4) අප්පිච්ඡතාව යනුවෙනි.
(5) උපේක්ෂාව යනුවෙනි.

**40.** පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් භක්තිය හා බෞද්ධ ශ්‍රද්ධාව පිළිබඳ ධර්මානුකූල ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රද්ධාවත් භක්තියත් සපුරා සමාන වේ.
(2) භක්තිය ශ්‍රද්ධාවේ පදනම ය.
(3) බෞද්ධයකු රත්නත්‍රය කෙරෙහි භක්තිමත් විය යුතු ය.
(4) බුදුදහමේ භක්තිය ගැන උගන්වා නැත.
(5) බොහෝ සූත්‍ර දේශනාවල භක්තිය අගය කර තිබේ.

**41.** ධනය ඉපැයීමේ පහසු මගක් සෙවූ තැනැත්තෙක් ඉවතලන කසල තේ, කුඩා ඇසුරුම්වල බහා අලෙවි කර සැපවත් ජීවිතයක් ගත කළේ ය. බුදුදහමේ උගන්වන නොකළ යුතු වෙළඳාම් අතරට නොවැටෙන බැවින්, "එය වරදක් නො වේ යැයි"ද හෙතෙම තර්ක කළේ ය. මේ පිළිබඳ ව කිව හැක්කේ,
(1) ඔහුගේ තර්කය නිවැරදි බවයි.
(2) එය මිච්ඡා ආජීවයක් බවයි.
(3) එය සම්මා කම්මන්තයක් වන බවයි.
(4) ඔහු හොඳ සැලසුමක් ඇති වෙළෙන්දකු බවයි.
(5) එය අත්ථි සුඛයට ඇතුළත් වන බවයි.

**42.** ධන පරිහරණයේ දී බෞද්ධයකු විසින් අනුගමනය කළ යුතු කරුණු රැසක් බුද්ධ දේශනාවන්හි විසිර තිබේ. එබඳු ධර්ම පාඨයක් වන්නේ,
(1) උට්ඨාතා වින්දතේ ධනං යන්නයි.
(2) ධනං සෙට්ඨංව රක්ඛති යන්නයි.
(3) නිස්සරණ පඤ්ඤං පරිභුඤ්ජති යන්නයි.
(4) ආරක්ඛෙන ගුත්තියා සම්පාදේති යන්නයි.
(5) විජිතේ අධනා අස්සු තේසංච ධනමුප්පාදෙය්‍යාසු යන්නයි.

**43.** බුදුදහම අනුව රාජ්‍ය පාලනය කළ යුත්තේ දසරාජ ධර්මයෙනි. එහි අජ්ජවං යන රාජධර්මයෙන් අදහස් වන්නේ,
(1) පරිත්‍යාගශීලී වීම ය. (2) අවංකව ක්‍රියා කිරීම ය.
(3) මුදු මොළොක් ආකල්ප ඇති බව ය. (4) ධනෝපායනයට උපකාර කිරීම ය.
(5) ජනතාවට ආරක්ෂාව ලබා දීම ය.

**44.** රාජ්‍යත්වය හා රාජ්‍ය පාලනය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් සූත්‍ර දේශනා රාශියකි. ඒ අතර මෘගපක්ෂීන් ආරක්ෂා කිරීම රජුගේ වගකීමක් ලෙස දක්වා ඇත්තේ,
(1) රජ්ජ සූත්‍රයේ ය.
(2) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(3) මහාපරිනිබ්බාන සූත්‍රයේ ය.
(4) අධම්මික සූත්‍රයේ ය.
(5) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

**45.** රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අතර හමු වන සප්ත අපරිහානීය ධර්මවල සඳහන් පරිදි, පාලකයා විසින් ප්‍රජාවගේ යහපත උදෙසා ගතයුතු ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) ධනෝපායන මාර්ග විවර කර දීම ය.
(2) පූජනීය ස්ථානවලට ගරුසත්කාර කිරීම ය.
(3) යුද භටයන්ට රක්ඛාවරණ ගුප්තිය සැලැස්වීම ය.
(4) මහජනයා වෙනුවෙන් ධනය පරිත්‍යාග කිරීම ය.
(5) ජනතාවගේ මානසික දියුණුවට අවශ්‍ය අනුග්‍රහය දැක්වීම ය.

**46.** පුහුදුන් සත්ත්වයන්ගේ සිත් සතන් තුළ නීවරණ පහක් උපදනා බව බුද්ධ දේශනාව උගන්වයි. සමථ භාවනාවෙන් යටපත් කළ හැකි එම නීවරණ අතර උද්ධච්ච කුක්කුච්ච නීවරණයෙන් අදහස් වන්නේ,
(1) මහන්තත්තකම හා සැකමුසු බවයි.
(2) උඩගුකම හා කුහක බවයි.
(3) තමා උසස් කොට අන් අය පහත් කොට සැලකීමයි.
(4) නොසන්සුන් බව හා පසුතැවිල්ලයි.
(5) උද්දාමය හා කුලෑටිකමයි.

**47.** බුදුදහම අනුව යෝගාවචරයකුට කුසල චිත්ත ඒකාග්‍රතාව තුළින් පිළිවෙළින් උපදවා ගත හැකි ධ්‍යාන සතරකි. එහි දෙවන ධ්‍යානය,
(1) පීති සුඛ එකග්ගතා සහිත ය.
(2) විතක්ක විචාර සහිත ය.
(3) විචාර පීති සුඛ එකග්ගතා සහිත ය.
(4) විතක්ක විචාර පීති සුඛ සහිත ය.
(5) සුඛ එකග්ගතා සහිත ය.

**48.** යෝගාවචරයකුට නීවරණාදී කෙලෙස් යටපත් කිරීමෙන් ලබාගත හැකි සමාපත්ති අටකි. ඒ අතර නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යනු,
(1) සතරවන අරූප ධ්‍යානයයි.
(2) විපස්සනාව තුළින් ලැබිය යුත්තකි.
(3) කිසිසේත් ම බිඳ නොවැටෙන ධ්‍යානයෙකි.
(4) ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ හැකියාවයි.
(5) බුදුසසුනෙන් බැහැරව ලැබිය නොහැක්කකි.

**49.** "යම් සේ සැරසෙන සුළු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ දීප්තිමත් කැඩපතක හෝ පහන් දිය බඳුනක සිය මුවසටහන පරීක්ෂා කර බලන්නේ ලප කැලැල් ආදී දොස් ඇති තැන් ඇතැ'යි ද නැති තැන් නැතැ'යි ද පැහැදිලි ව දකියි." මෙම උපමාව මගින් පැහැදිලි කරන්නේ,
(1) දිබ්බචක්ඛු ඥාණයයි.
(2) පස්වන සමාපත්ති ඥාණයයි.
(3) විපස්සනා ඥාණයයි.
(4) මනෝමය ඍද්ධි ඥාණයයි.
(5) චෙතෝපරිය ඥාණයයි.

**50.** බුදුසමයෙහි ඉගැන්වෙන මූලික භාවනා ක්‍රම දෙක නම් සමථය හා විපස්සනාව ය. විපස්සනාව පිළිබඳ නිවැරදි හැඳින්වීම කුමක් ද?
(1) සමකාලීන ශ්‍රමණයන් විසින් ද වඩන ලද භාවනාවකි.
(2) විදර්ශනාවෙන් සම්මා ආජීවය වැඩේ.
(3) දුක් කෙළවර කරන්නේ විදසුන් වැඩීමෙනි.
(4) විදර්ශනාව කෙළෙස් යටපත් කරයි.
(5) විදසුන් වඩා රහත් විය නොහැකි ය.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

| විෂය අංකය<br>பாட இலக்கம் | 41 | විෂයය<br>பாடம் | බුද්ධ ධර්මය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 4 | 31. | 3 | 41. | 2 |
| 02. | 2 | 12. | 4 | 22. | 3 | 32. | 2 | 42. | 3 |
| 03. | 3 | 13. | 1 | 23. | 5 | 33. | 2 | 43. | 2 |
| 04. | 4 | 14. | 4 | 24. | 4 | 34. | 4 | 44. | 2 |
| 05. | 2 | 15. | 1 | 25. | 3 | 35. | 1 | 45. | 2 |
| 06. | 5 | 16. | 2 | 26. | 5 | 36. | 4 | 46. | 4 |
| 07. | 4 | 17. | 5 | 27. | 5 | 37. | 5 | 47. | 3 |
| 08. | 4 | 18. | 2 | 28. | 5 | 38. | 5 | 48. | 1 |
| 09. | 5 | 19. | 1 | 29. | 4 | 39. | 1 | 49. | 5 |
| 10. | 5 | 20. | 2 | 30. | 4 | 40. | 4 | 50. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

## II පත්‍රය

## I කොටස

01.

(i) **බුදුසිරිතේ දක්නට ලැබෙන ආශ්චර්යමත් කරුණු අතරෙන් එකක් නම් කරන්න.**

ම.නි. නිකායේ අච්ඡරියබ්භූත සූත්‍රයෙහි සඳහන් තථාගතයන් වහන්සේගේ ආශ්චර්ය අද්භූත ධර්ම අතුරින් එකක් නම් කිරීම.

*(ලකුණු 02)*

(ii) **'සම්මාසම්බුද්ධ' ගුණය ධර්මානුකූලව හඳුන්වන්න.**

පරෝපදේශ රහිතව සද්ධර්මය ස්වයම්භූඥානයෙන් අවබෝධ කල බැවින් සම්මා සම්බුද්ධ නම් වන බව. මේ පිළිබඳ බුදුගුණාලංකාරයේ එන පද්‍යය දැක්වීම ද ප්‍රමාණවත් ය.

*(ලකුණු 04)*

(iii) **'ආසයානුසය ඤාණය' විස්තර කරන්න.**

සත්වයන්ගේ චිත්තසන්තානවල පවත්නා ශාස්වත උච්ඡේද ආදී දෘෂ්ටි පදනම් කරගෙන ඇති මතවාද ආසය යනුවෙන් හැඳින්වේ. එම දෘෂ්ටිවාද ආදියත් කාම, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, භව, අවිජ්ජා යනාදියත් අනුසය ධර්ම නම් වේ. මෙය ආසය, අනුසය තේරුම් ගැනීමේ ඥානයයි.

*(ලකුණු 06)*

(iv) **බුදුරදුන්ගේ ආගමික සහනශීලීතාව සනිදර්ශනව අගය කරන්න.**

ම.නි. උපාලි සූත්‍රය සහ දී.නි. උදුම්බරික සීහනාද සූත්‍රය වැනි දේශනා අනුව එකල පිළිගත් උගත් අබෞද්ධයන් දහම අසා පැහැදී තෙරුවන් සරණ ගිය පසුව ද සිතා විමසා ක්‍රියා කරන්නැයි ද තව දුරටත් පූර්වයෙහි සිටි ආගමික ගුරු උතුමන්ට දානාදියෙන් සංග්‍රහ කරන්නැයි ද පැවසීම. ඉහත දෙවැනි දේශනාව අනුව බුදුරදුන් වදාළේ මා මෙතෙක් වේලා දහම් දෙසුවේ ඔබ බෞද්ධයෙකු කරගන්නට නොව කරුණු පැහැදිලි කරදීමට පමණක් බව යන ප්‍රකාශය.

*(ලකුණු 08)*

02.

(i) **'ස්වාක්ඛාත' දහම් ගුණය හඳුන්වා දෙන්න.**

මැනවින් ප්‍රකාශිත යන්න මෙහි වචනාර්ථය බව. නොමනා කොට පවසන දහමක නිරතවීමෙහි ඵලක් නැත. බුදුදහම ස්වාක්ඛාත බැවින් එහි වීර්යාරම්භය ප්‍රතිඵලදායක බව.

*(ලකුණු 02)*

(ii) **'බුදුදහම අනීශ්වරවාදීය' පැහැදිලි කරන්න.**

බුද්ධකාලීන වෛදික බ්‍රාහ්මණ සම්ප්‍රදාය ඊශ්වරවාදී වන බව. ඒ අනුව සර්වබලධාරී, සර්වඥ, සර්වතෝභද්‍ර, නිර්මාපක, ඊශ්වරයකු පිළිගත් බව, බුදුසමය එම ඉගැන්වීම බැහැර කල බැවින් අනීශ්වරවාදී වන බව.

*(ලකුණු 04)*

(iii) **'අනත්තානුපස්සනාව' යනු කුමක්දැ'යි විස්තර කරන්න.**

නිත්‍ය වූ ආත්මයක් ඇතැයි පිළිගැනීම ශ්‍රමණ බ්‍රාහ්මණාදී බොහෝ චින්තකයන් අතර පැවැති බව. එම පිළිගැනීම පසෙකින් තබා ස්කන්ධ ධාතු ආයතනාදී සියලු සංස්කෘත ධර්ම අනාත්ම යැයි සිහි කිරීම අනත්තානු පස්සනාවයි. එම ධර්ම මගේ නොවේ. මම නොවෙමි. මගේ ආත්මය නොවේ යැයි සිහි කිරීම මින් අදහස් වන බව.

*(ලකුණු 06)*

(iv) **'බුදුදහම අනුව ආත්මාර්ථය හා පරාර්ථය සමබර විය යුතු ය' විමසන්න.**

ආත්මාර්ථයෙන් තොර පරාර්ථයක් හෝ පරාර්ථයෙන් තොර ආත්මාර්තයක් හෝ බුදුසමයේ උගන්වා නැති බව අදාළ මූලාශ්‍රය ඇසුරින් දක්වා තිබීම. බෞද්ධයෙකු තමාගේ අර්ථ සිද්ධිය මෙන්ම අනුන්ගේ අර්ථ සිද්ධියද සමබරව සාධනය වන සේ ක්‍රියාකල යුතු බව. ඉන් එකක් අඩු හෝ වැඩි වීම ධර්මානුකූල නොවන බව.

*(ලකුණු 08)*

03.

(i) **බුද්ධකාලීන ශ්‍රමණ සමාජයේ සුවිශේෂතා දෙකක් නම් කරන්න.**

බ්‍රාහ්මණ සම්ප්‍රදායට සාපේක්ෂව ශ්‍රමණ සමාජයේ පැවැති නිර්මාණවාදී නොවීම, යාතු කර්මාදිය නොපිළිගැනීම, වර්ණාශ්‍රම ධර්ම නොසලකා හැරීම, සංචාරක ජීවිතය, පිණ්ඩපාතය, බ්‍රහ්මචාරී වීම, විවිධ ව්‍රත සමාදානය ආදි කරුණු වලින් දෙකක්.

*(ලකුණු 02)*

(ii) **'සාමණේර' යන්න අර්ථකථනය කරන්න.**

අනුපසම්පන්න භික්ෂූන් වහන්සේ සාමනේර නම් වන බව. ශ්‍රමනයාගේ පුත්‍රයා පුහුණුවන්නා යන අර්ථය එහි ඇති බව. සාමණේර දස ශීලය මූලික වශයෙන් ආරක්ෂා කිරීම එම පැවිද්දාගෙන් අපේක්ෂා කරන බව. වයසින් මුහුකුරා ගියද ඔහු වැඩිහිටි පැවිද්දෙකු නොවන බව යනාදී කරුණු ඇසුරින් අර්ථකථනය ඉදිරිපත් කිරීම.

*(ලකුණු 04)*

(iii) **'දූතෙන උපසම්පදා' යන්න පැහැදිලි කරන්න.**

දූතයෙක් මගින් උභතොසංඝයා වෙතින් උපසම්පදාව ඉල්ලා සිටීම මින් අදහස් වන බව. වෙසඟනකව සිටි අඩ්ඪකාසිට අවස්ථා කිහිපයකදී උපසම්පදාව ලබාගැනීමට යාම අනතුරුදායක යැයි භික්ෂුණීන් පැවසූ බැවින් දූතයෙකු මගින් උපසම්පදාව ලබාදුන් බව.

*(ලකුණු 06)*

(iv) **භික්ෂු සමාජයේ ගුරු-සිසු සබඳතා පිළිබඳව බුදුරදුන්ගේ පැනවීම්වල ප්‍රායෝගික අගය විමසන්න.**

විනය මහාවර්ගයේ දැක්වෙන අන්තේවාසික, සිද්ධිවිහාරික නම් වූ ශිෂ්‍යා විසින් ආචරිය උපාධ්‍යාය යන සිය ගුරුවරයාට වතාවත් කිරීම, කීකරු වීම, රෝගී වූ විට උවටැන් කිරීම ආදිය ද ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ආපත්ති අනාපත්ති කියාදීම රෝගී වූ විට උවටැන් කිරීම. අවශ්‍යතා පිළිබඳ සොයාබැලීම ආදී වත් ඉටුකළ යුතු යැයි දැක්වීම හා එහි ප්‍රායෝගික අගය නිදසුන් සහිතව දැක්වීම.

*(ලකුණු 08)*

## II කොටස

04.

(i) **'සුත්ත' යන පදයෙහි අර්ථ විභාග කරන්න.**

අරුත් දක්වන බැවින් ද, මනාකොට ප්‍රකාශ කරන ලද බැවින් ද, අසන බැවින් ද, පැසවන බැවින් ද, ධර්ම කරුණු එකිනෙක නූලක මෙන් අමුණා ඇති බැවින් ද සූත්‍ර යැයි කියන ලදී. මේ අතුරින් කරුණු හතරක් වත් දක්වා තිබීම.

*(ලකුණු 08)*

(ii) **අභිධර්ම පිටකයේ සැකැස්ම පිළිබඳ විස්තරයක් කරන්න.**

අභිධර්ම පිටකය ප්‍රකරණ සතකින් යුක්ත වන බව, එකී ප්‍රකරණ නම් කිරීම හා සැකෙවින් හැඳින්වීම මින් අදහස් කරන බව. අවම වශයෙන් ඒ ඒ ප්‍රකරණ හඳුන්වා ඇති නාම තේරුම් කිරීම අපේක්ෂිතය.

*(ලකුණු 12)*

05.

(i) **'වානප්‍රස්ථ-සන්‍යාසි' යන බ්‍රාහ්මණ ආශ්‍රමධර්ම හඳුන්වා දෙන්න.**

බමුණු සමයට අනුව චතුර්විධ ආශ්‍රම ධර්මවල අවසන් ආශ්‍රම දෙක වානප්‍රස්ථ හා සන්‍යාසි නම් වන බව. එම ආශ්‍රම ධර්ම පසුකාලීනව ශ්‍රමන නැගීමත් සමග බමුණන් අතර සම්භාවිත යැයි සැළකෙන බව. මෙම ආශ්‍රම ධර්ම මගින් ඥාන මාර්ගයට වැඩි නැඹුරුවීමක් පෙනෙන බව.

*(ලකුණු 08)*

(ii) **'බ්‍රහ්ම සහව්‍යතාව' පිළිබඳ ප්‍රමාණවත් විමසුමක් කරන්න.**

වෛදික - බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව බ්‍රාහ්ම සහව්‍යතාව යනු පරම නිෂ්ඨාවයි. විමුක්තියයි. වේද අධ්‍යයනය හා ඒ අනුව ක්‍රියා කිරීම. යාගහෝමාදිය සිදු කිරීම ඔස්සේ බ්‍රහ්ම සහව්‍යතාව එනම් බ්‍රහ්මයාගේ පරමාත්මය සමග එක්වීමට හැකියැයි බමුණු දහම උගන්වන බව. එයම විමුක්තිය සේ සැලකූ බව.

*(ලකුණු 12)*

06.

(i) **'දුක්ඛ නිරෝධාර්ය සත්‍යය' ධර්මානුකූලව පැහැදිලි කරන්න.**

දුක්ඛ නිරෝධය යනු නිවනයි. ජරාමරණාදී සංසාරගත දුක් දොම්නස්වල නිමාවයි. තණ්හාව නැති කිරීමයි. භව නිරෝධයයි. ලෝභ, දෝෂ හා මෝහා දී කෙලෙස් සපුරා බැහැර කිරීමයි. දේශනානු සාරයෙන් කරුණු දැක්වීම අපේක්ෂිතයි.

*(ලකුණු 08)*

(ii) **'ත්‍රිවිධ ශික්ෂාවෝ එකිනෙකට උපකාරී වෙති' විමසන්න.**

සීලය සීලය සඳහාම නොවේ. සමාධිය සඳහාය. සමාධිය ද ඒ සඳහාම නොවේ. ප්‍රඥාව සඳහාය. මෙසේ ත්‍රිවිධ ශික්ෂාවෝ එකිනෙකට උපකාරී වෙති. එක් ශික්ෂාවක් නැතිව අනෙක් ශික්ෂාව අර්ථවත් වන්නේ නැත. ත්‍රිවිධ ශික්ෂාවන් අන්‍යෝන්‍ය උපකාරිත්වයක් ඇති බව විමර්ශනාත්මකව දැක්වීම.

*(ලකුණු 12)*

07.

(i) **අනුලෝම පටිච්චසමුප්පාදය අනුව දුක්ඛ සමුදය පැහැදිලි කරන්න.**

චතුරාර්ය සත්‍ය අනවබෝධය හෙවත් අවිද්‍යාව ප්‍රත්‍යකොටගෙන කුසලාකුසල කර්ම හෙවත් සංස්කාර රැස්වීම. (අවිජ්ජා පච්චය සංඛාර) වේ. මෙසේ ද්වාදසාංගික පටිච්චසමුප්පාදයේ අනුලෝම දේශනාවෙහි එක් එක් අංගවල මූලික අර්ථ දක්වමින් එම හේතුප්‍රත්‍ය ඔස්සේ දුක්ඛ සමුදය සිදුවන බව පැහැදිලි කිරීම. (එවමෙතස්ස ............... දුක්ඛක්ඛන්ධස්ස සමුදයොහෝති)

*(ලකුණු 08)*

(ii) **'සමාජගත ගැටලු වුව ද පටිච්චසමුප්පන්නය' විමසන්න.**

දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය චක්කවත්ති සීහනාද සූත්‍රය අං.නි. අධම්මික සූත්‍රය වැනි සූත්‍රවලින් දෙකක්වත් ඇසුරුකොට ගනිමින් සමාජගත ගැටළු පිළිබඳ හේතුප්‍රත්‍යාකාරය බුදුදහමේ පෙන්වාදී ඇති බව විමසීම.

*(ලකුණු 12)*

08.

(i) **ආර්ථිකය හා දේශපාලනය අතර ඇති සම්බන්ධය සූත්‍රානුසාරයෙන් පෙන්වා දෙන්න.**

ආර්ථිකය පිරිහීමෙන් රාජ්‍ය පාලනයද රාජ්‍ය පාලනය පිරිහීමෙන් ආර්ථිකයද පිරිහෙන ආකාරයත්, එසේම ඉන් එකක් දියුණු වීමෙන් අනෙකද දියුණු වන ආකාරයත් සූත්‍රානුසාරයෙන් පෙන්වා දීම. දී.නි. චක්ක්වත්තිසීහනාද, අග්ගඤ්ඤ, කූටදත්ත වැනි සූත්‍ර ඇසුරුකොට තිබීම සැළකිය යුතුය.

*(ලකුණු 08)*

(ii) **නීතිය හා සාමය සුරක්ෂිත කරනු පිණිස පාලකයකු කෙසේ ක්‍රියා කළ යුතුදැ'යි බුද්ධානුශාසනය ඇසුරෙන් සාකච්ජා කරන්න.**

දසරාජ ධර්මවල අක්කෝධ, අවිහිංසා, ඛන්ති, අවිරෝධතා වැනි රාජ්‍ය පාලකයකුගේ ක්‍රියාකාරකම් ඔස්සේ ද දස සක්විති වත්වල සියලු ජන කොටස්වල රක්ෂාවරණ ගුත්තිය සැලසීම හා අධර්ම ක්‍රියා වැළැක්වීම වැනි කරුණු ඔස්සේ ද සප්ත අපරිහානිය ධර්මවල පැනවූ නීති නොකැඩීම හා නොපැනවූ නීති නොපැනවීම වැනි පිළිවෙත් ඔස්සේ ද ක්‍රියා කළ යුතුයැයි පාලකයන්ට අනුශාසනා කොට තිබීම සාකාච්ඡා විය යුතුය.

*(ලකුණු 12)*